362060

ISSN 1391 - 0000

# පුස්තකාල ප්‍රවෘත්ති
# நூலகச் செய்திகள்
# LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය
இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்
THE NEWS LETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

27 වන වෙළුම 1/2 කලාප, 2006 ජනවාරි-මාර්තු/අප්‍රේල්-ජූනි
மலர் 27 இதழ் 1/2 ஜனவரி/மார்ச்-ஏப்ரல்/யூன் 2006
Volume 27, No. 1-2, January-March/April-June, 2006

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board



පිලිපීනයේ මැනිලා නුවර දී පැවැත් වූ
ආසියා ශාන්තිකර කලාපීය රටවල
ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ
19 වන වාර්ෂික සමුළුව

ஆசியா மற்றும் ஓசியானியா நாடுகளின் தேசிய நூலகங்களின் நிர்வாக இயக்குநர்களுக்கான 19வது வருடாந்த மாநாடு பிலிப்பீன்சின் மணிலாவில் நடைபெற்றது.

The 19th Annual Conference of Directors of National Library in Asia and Oceania held in Manila Philippine

2006.03.26 - .30

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ
වාර්ෂික සමුළුව
BMICH හි දී

இலங்கை நூலகச் சங்கத்தின் வருடாந்த பொதுக்கூட்டம்

The Annual General Meeting of the Sri Lanka Library Association

2006.06.30





362060

12 JAN 2009

# පුස්තකාල ප්‍රවෘත්ති

## LIBRARY NEWS நூலகச் செய்திகள்

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் செய்திப் பத்திரிகை

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

ආරම්භය 1973 - Commenced 1973 - ஆரம்பம் 1973

27 වන වෙළුම 1/2 කලාප
2006 ජනවාරි-මාර්තු /
අප්‍රේල්-ජූනි

**සංස්කාරක උපදේශක මණ්ඩලය**

ඊ.ඒ.සමරසිංහ
**සභාපති**

ඩබ්.එම්.එම්.කේ.වීරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

**සංස්කාරක මණ්ඩලය**
ජී.ඩී.අමරසිරි
නාලනී මල්ලවාරච්චි
ඩබ්.සුනිල්
ටී.ශ්‍රීධරන්
එම්.අරවින්ද
එස්. සූරියබණ්ඩාර

**පරිගණක අක්ෂර සංයෝජනය සහ පිටු සැකසීම**
පී.එස්.කේ.ලියනගේ

**මුද්‍රණය හා ප්‍රකාශනය**
ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව

දුරකථනය : 011- 2687583
011- 2698847- 261
ෆැක්ස් : 94- 011-2687583
ඊ මේල් : pub@mail.natlib.lk
වෙබ් අඩවිය : www.natlib.lk

ජාතික පුස්තකාල හා
ප්‍රලේඛන සේවා මණ්ඩලය
2006

**කලාපයක මිල**
රුපියල් 50.00 US $ 5.00
වසරක දායක මුදල රුපියල් 200.00

චෙක්පත් හා මුදල් ඇණවුම "සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය" නමට යොමුකරන්න

පිටකවරය මුද්‍රණය
දීපානී ප්‍රින්ටර්ස්
නුගේගොඩ

**மலர் 27 இதழ் 1/2,**
**ஜனவரி - மார்ச் /**
**ஏப்ரல் - ஜூன் 2006**

**பதிப்பாசிரியர் ஆலோசனைக்குழு**

ஈ.ஏ. சமரசிங்ஹ
**தலைவர்**

டபிள்யு.எம். எம். கே. விக்கரமசிங்ஹ
**பணிப்பாளர் நாயகம்**

**பதிப்பாசிரியர் குழு**
ஜி.டி.அமரசிறி
நாலனி மல்லவஆராய்ச்சி
டபிள்யூ. சுனில்
ரி. சிரிதரன்
எம்.அரவிந்த
எஸ். சூரியபண்டார

**கணினி வடிவம்**
பீ.எஸ்.கே. லியனகே

**அச்சிட்டு வெளியிடல்**
வெளியீட்டுப் பிரிவு
தேசிய நூலக ஆவணவாக்கல்
சேவைகள் சபை, சுதந்திர வழி,
கொழும்பு 07
இலங்கை

தொலைபேசி : 011 - 2687583
011 - 2698847 -261
பெக்ஸ் : 94-011-2687583
இ.மெயில் : pub@mail.natlib.lk
வெப்தளம் : www.natlib.lk

தேசிய நூலக ஆவணவாக்கல்
சேவைகள் சபை
2006

**பிரதியின் விலை**
ரூபா 50.00 $ 5.00
ஆண்டுச் சந்தா ரூபா. 200.00
சகல காசோலைகளும், தபால்
கட்டளைகளும்

**தலைவர்**
**தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் பெயருக்கு எழுதப்பட வேண்டும்**

**வெளிமட்டை அச்சிடல்**
**தீபானீ பிரின்டர்ஸ்**
**நுகேகொட**

**Volume 27 No. 1/2**
**January-March /**
**April-June 2006**

**Editorial Advisory Board**

E.A.Samarasinghe
**Chairman**

W.M.M.K. Weerasinghe
**Director General**

**Editorial Board**
G.D.Amarasiri
Nalani Mallawarachchi
W.Sunil
T.Sridharan
M.Aravinda
S. Sooriyabandara

**Computer Typesetting and Page Setup**
P.S.K. Liyanage

**Printed and Published by**
Publication and Book Development Division
National Library and Documentation Services Board
No. 14, Independence Avenue
Colombo 07
Sri Lanka

Tel :011-2687583
011-2698847-261
Fax :94- 011 -2687583
e mail :pub@mail.natlib.lk
web page :www.natlib.lk

National Library and
Documentation Services Board
2006

**Price**
Rs. 50.00 US $5.00
Annual Subscription Rs.200.00
All Cheques and Money Orders should be forwarded to
**Chairman**
**National Library and Documentation Services Board**

**Cover Printed by**
**Deepani Printers**
**Nugegoda**

# පටුන


| | |
|---|---|
| කතුවැකිය | 03 |
| ජාතික පුස්තකාල පුවත් | 04-08 |
| **தேசிய நூலகச் செய்தி** | 09-11 |
| National Library News | 12-14 |
| සම්පත් පාදක අධ්‍යාපනය සහ තොරතුරු කුසලතා | 15-18 |
| Empowering 8: the information literacy model developed in Sri Lanka to underpin changing education paradigms of Sri Lanka | 19-25, 32 |
| තොරතුරු ගවේෂණය පහසුවන ප්‍රලේඛන සේවා | 26-28, 32 |
| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය 2005 යටතේ අනුග්‍රහය ලබා ප්‍රකාශයට පත් කළ කෘතීන් පිළිබඳ විස්තර අඩංගු ලේඛනයෙන් කොටසක් | 29-32 |

362060

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
පොත් සහ පුවත්පත් පිළිබඳ
රෙජිස්ට්‍රාර් කාර්යාලය
12 JAN 2009
ශ්‍රී ලංකා SRI LANKA ශ්‍රී ලංකා

කතුවැකිය

# ජාතික ඒකාබද්ධ සූචිය

කිසියම් රටක පුස්තකාල සතු පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු ග්‍රන්ථ විද්‍යාත්මකව සංවිධානය කරනු ලැබූ ලැයිස්තුව ජාතික ඒකාබද්ධ සූචිය ලෙස හැඳින්වේ. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම හා පවත්වාගෙන යෑම සෑම රටකම ජාතික පුස්තකාලය වෙත පැවරෙන ප්‍රධාන වගකීමකි. සියලුම වර්ගයේ ප්‍රධාන පුස්තකාලවල විසිරී ඇති පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු එක් ස්ථානයකින් ලබාදීම ජාතික ඒකාබද්ධ සූචියේ මූලික පරමාර්ථය වේ. එබැවින් විවිධ පුස්තකාලවල ඇති පොත්පත් හා වෙනත් පුස්තකාල මූලාශ්‍ර පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචියට අන්තර්ගත විය යුතුය.

ජාතික ඒකාබද්ධ සූචිය තුළින් ඒ සඳහා දායක වී ඇති පුස්තකාලවල ඇති පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු පර්යේෂකයන්ට හා වෙනත් පාඨකයන්ට ලබා දීමට හැකිවීම, සම්පත් අත්පත් කර ගැනීමේදී ඇතිවන ද්වීත්වකරණය වළක්වා ගැනීමට හැකිවීම, අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමය තුළින් සම්පත් බෙදා හදා ගැනීමට හැකිවීම ආදී කරුණු සඳහා ජාතික ඒකාබද්ධ සූචිය ප්‍රයෝජනවත් වේ.

උක්ත පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ අපේක්ෂාවෙන් ජාතික පුස්තකාලය මගින් 1986 වර්ෂයේ දී ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය ආරම්භ කරන ලදී. 1986 වසරේ පුස්තකාල 06 ක් දායක වී ආරම්භ කළ ඒකාබද්ධ සූචිය 2007 වසර වන විට දායක පුස්තකාල 75 දක්වා වර්ධනය වී ඇත. විශ්වවිද්‍යාල පුස්තකාල, මහජන පුස්තකාල, රජයේ දෙපාර්තමේන්තු පුස්තකාල, රජයේ නොවන ආයතන පුස්තකාල, විශේෂ පුස්තකාල හා කාර්මික පුස්තකාල ජාතික ඒකාබද්ධ සූචියට දායක වී ඇති පුස්තකාල වර්ග වේ.

1996 වසරේ දී ජාතික ඒකාබද්ධ සූචිය පරිගණක ගත කිරීම ආරම්භ කරන ලදී. දායක පුස්තකාල බොහොමයක් විද්‍යුත් තැපැල මගින් ද සංගෘහිත තැටි මගින් ද තොරතුරු ලබා දෙනු ලැබේ. සමහර පුස්තකාල සූචි පත්‍රිකා, පරිග්‍රහණ ලේඛන ලැයිස්තු ස්වරූපයෙන් ද ජාතික ඒකාබද්ධ සූචිය සඳහා තොරතුරු ලබා දෙනු ලැබේ. 2001 වසරේ දී ජාතික ඒකාබද්ධ සූචිය මාර්ගගත සූචියට (OPAC) සම්බන්ධ කරනු ලැබූ අතර දැනට එය අන්තර් ජාලයට ද ඇතුළත් කර ඇත. ජාතික පුස්තකාල වෙබ් අඩවිය ඔස්සේ ඒකාබද්ධ සූචිය පරිශීලනය කළ හැක. (www.natlib.lk)

සංස්කාරක

# පුවත්

## ජාතික පුස්තකාල දේශන මාලා

ජාතික පුස්තකාල දේශන මාලා යටතේ 2006 වසරේ ජනවාරි මස සිට ජූනි මස දක්වා පැවැත්වූ දේශන

| දිනය | දේශක | මාතෘකාව |
|---|---|---|
| 2006.01.26 | ආචාර්ය ආර්.එච්.අයි.එස්. රණසිංහ මහත්මිය | ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය පිළිබඳව නව තොරතුරු |
| 2006.02.22 | දූෂ්‍යන්ති ඩැනියෙල් මහත්මිය | The Tsunami Affected Libraries in Sri Lanka; Present Situation |
| 2006.03.28 | ආචාර්ය නන්දන කරුණානායක මහතා | මාධ්‍ය ප්‍රතිපත්තියක් සැකසීම හා එහි අභියෝග |
| 2006.04.27 | ඩබ්.එස්.පුන්‍යවර්ධන මහතා | අග්නිදිග ආසියා කලාපයේ පුස්තකාලයාධිපතීන්ගේ සංගමයේ 2006 මැනිලා සමුළුවෙන් ලැබූ අත්දැකීම් |
| 2006.05.31 | ආචාර්ය ගැමුණුසිරි ගමගේ මහතා | බුදුන්වහන්සේගේ මනුෂ්‍යත්වය සහ ප්‍රාතිහාර්ය බලය |
| 2006.06.22 | ගාමිණී වියන්ගොඩ මහතා | පරිවර්තන සාහිත්‍යය සහ මගේ අත්දැකීම් |

## පුහුණු පාඨමාලා

2006 වසරේ ජනවාරි මස සිට ජූනි මස දක්වා කාලය තුළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පැවැත්වීමට යෙදුණු පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| තේමාව | ස්ථානය, දිනය | සහභාගිත්වය |
|---|---|---|
| ♦ පාසල් පුස්තකාලයක පුස්තකාල ද්‍රව්‍ය වර්ගීකරණය සහ සූචිකරණය | කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලය 2006 මාර්තු 16 -18 | කෑගල්ල අධ්‍යාපන කලාපයේ පාසල් පුස්තකාලයාධිපතිවරු 45 දෙනෙක් සහභාගි වූහ. |
| ♦ මහජන පුස්තකාල කළමනාකරණය | වයඹ පුහුණු මධ්‍යස්ථානය වාරියපොල 2006 මැයි 18-20 | වයඹ පළාතේ මහජන පුස්තකාලයාධිපතිවරු 37 දෙනෙක් සහභාගි වූහ. |
| ♦ මහජන පුස්තකාල කළමනාකරණය | වයඹ පුහුණු මධ්‍යස්ථානය වාරියපොල 2006 මැයි 18 | වයඹ පළාතේ ප්‍රජා සංවර්ධන නිලධාරීහු 23 දෙනෙක් සහභාගි විය |
| ♦ පුස්තකාල භාවිතය හා කියවීමේ රුචිය වර්ධනය කිරීම | මීරිගම හාපිටිගම අධ්‍යාපන විද්‍යාපීඨය 2006 ජූනි 16-18 | මීරිගම හාපිටිගම අධ්‍යාපන විද්‍යාපීඨයේ පුහුණුව ලබන ගුරු සිසුහු 200 දෙනෙක් පමණ සහභාගි වූහ. |

## පොත්පත් සංරක්ෂණය කරන්නේ කෙසේද?

පුස්තකාලවල පවත්නා පොතපත ඇතුළු අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය විධිමත් ලෙස සංරක්ෂණය කිරීම පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු පාඨමාලා දෙකක් 2006 මාර්තු මස 08-10 සහ 2006 මැයි මස 24-26 දිනවල ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පවත්වන ලදී. මෙම පුහුණු පාඨමාලා සඳහා විවිධ පුස්තකාල නියෝජනය කරමින් නිලධාරීහු 26 දෙනෙක් සහභාගි වූහ.

## සුනාමි විපතින් හානියට පත් පුස්තකාලවල මානව සම්පත් සංවර්ධනයට අතදීම

සුනාමි විපතින් හානියට පත් පුස්තකාල නැවත නගා සිටුවීම හා ඒවායේ සේවා විධිමත් කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් කිහිපයක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සංවිධානය කරන ලදී. මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ දී ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය ද සහයෝගය ලබා දී තිබේ. මෙම පුහුණු වැඩසටහන් පහත පරිදි පවත්වා තිබේ.

| තේමාව | සහභාගීත්වය | ස්ථානය හා දිනය |
|---|---|---|
| 1. මහජන පුස්තකාල කළමනාකරණය | බස්නාහිර හා දකුණු පළාත්වල මහජන පුස්තකාලයාධිපතිවරු | ජාතික පුස්තකාල ශ්‍රවණාගාරය 2006 අප්‍රේල් 06-08 |
| 2 පාසල් පුස්තකාල සේවා සංවිධානය | පාසල් පුස්තකාලයාධිපතිවරු | ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS) 2006 මැයි 03-05 |
| 3. මහජන පුස්තකාල කළමනාකරණය | උතුරු හා නැගෙනහිර පළාත්වල මහජන පුස්තකාලයාධිපතිවරු (දෙමළ මාධ්‍ය) | ජාතික පුස්තකාල ශ්‍රවණාගාරය 2006 මැයි 03-05 |
| 4. පුස්තකාල සේවා සංවිධානය | මහජන පුස්තකාලවල පුස්තකාල සහකාරවරු | ජාතික පුස්තකාල ශ්‍රවණාගාරය 2006 මැයි 08-10 |
| 5. පුස්තකාල කළමනාකරණය | මහජන හා පාසල් පුස්තකාල හැර අනෙකුත් පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා | ජාතික පුස්තකාල ශ්‍රවණාගාරය 2006 මැය 17-18 |
| 6. පුස්තකාල සේවා සංවිධානය | උතුරු හා නැගෙනහිර පළාත්වල මහජන පුස්තකාලවල පුස්තකාල සහකාරවරු | ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය 2006 මැයි 25-26 |

## සුනාමි විපතින් හානියට පත් පුස්තකාල සඳහා ලී බඩු උපකරණ

සුනාමි ව්‍යසනයෙන් හානියට පත් පුස්තකාල සඳහා ලී බඩු පරිත්‍යාග කිරීම යටතේ 2006 වසරේ මුල් භාගයේ දී පුස්තකාල 09 ක් සඳහා රුපියල් මිලියනයකට අධික වටිනාකමින් යුත් ලී බඩු කට්ටල පරිත්‍යාග කර තිබේ. එම පුස්තකාල නම්, පානදුර වැල්ලබඩ ශාඛා පුස්තකාලය, බේරුවල මරදාන ශාඛා පුස්තකාලය, කතළුව මහජන පුස්තකාලය, අම්බලන්ගොඩ හිරේවත්ත මහජන පුස්තකාලය, පොතුවිල් කෝමාරි මහජන පුස්තකාලය, පොතුවිල් වින්නවුලෙයි මහජන පුස්තකාලය, අඩ්ඩාලච්චේනයි මහජන පුස්තකාලය, ඔලුවිල් මහජන පුස්තකාලය සහ නාවලඩි ශාඛා පුස්තකාලයයි. මෙම පරිත්‍යාග යටතේ ලී බඩු කට්ටලයක් සඳහා කියවීමේ මේස හා පුටු, පොත් රාක්ක, පොත් අල්මාරි, ආලින්ද පුටු හා පුවත්පත් පුවරු ඇතුළත් වේ.

## පුස්තකාල ශ්‍රේණිගත කිරීම

පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන යටතේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් දිවයිනේ පාසල් පුස්තකාල 09 ක් පළමු ශ්‍රේණියේ පාසල් පුස්තකාල වශයෙන් ශ්‍රේණිගත කොට තිබේ.

- කු/සිරි මයුරපාද මධ්‍ය මහා විද්‍යාලයීය පුස්තකාලය, කුරුණෑගල
- කු/ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයීය පුස්තකාලය, ඉබ්බාගමුව
- කු/සඳලංකාව මධ්‍ය මහා විද්‍යාලයීය පුස්තකාලය, සඳලංකාව
- කුලි/එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක ජාතික පාසල් පුස්තකාලය, කුලියාපිටිය
- කො/ඩී.එස්.සේනානායක විද්‍යාලයීය පුස්තකාලය, බොරැල්ල, කොළඹ 08
- කො/නාලන්දා විද්‍යාලයීය පුස්තකාලය, මරදාන, කොළඹ 10
- කො/රාජකීය විද්‍යාලයීය පුස්තකාලය, කොළඹ 07
- කො/හින්දු විද්‍යාලයීය පුස්තකාලය, බම්බලපිටිය
- ගම්/බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලයීය පුස්තකාලය, ගම්පහ
- නික/ශ්‍රී පරාක්‍රමබාහු ජාතික පාසල් පුස්තකාලය, නිකවැරටිය

## ආරාධිත දේශකයකු වශයෙන් ජේ.ඒ.අමරවීර මහතා ඉන්දියාව බලා පිටත්ව යයි

ඉන්දියාවේ පන්ජාබ් ප්‍රාන්තයේ අම්රිත්සාර් නුවර ගුරුනානක් දේව් විශ්වවිද්‍යාලයේ විශේෂ ආරාධනයක් මත ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ජේ.ඒ.අමරවීර මහතා සති දෙකක කාලයක් සඳහා ඉන්දියාව බලා පිටත්ව ගොස් තිබේ. 2006 පෙබරවාරි මස 05-14 දක්වා එම විශ්වවිද්‍යාලයේ ගතකළ කාලය තුළ පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව හදාරණ සිසුන් සඳහා දේශන කිහිපයක් පැවැත්වීමට කටයුතු කොට තිබේ. අමරවීර මහතාගේ ඉන්දීය චාරිකාවේ දී හර්යානා ප්‍රාන්තයේ සුප්‍රකට විශ්වවිද්‍යාලයක් වන කුරුක්ෂේත්‍ර විශ්වවිද්‍යාලයෙන් ලද විශේෂ ආරාධනයකට අනුව "ශ්‍රී ලංකාවේ පුස්තකාලයාධිපතිත්වය හා එහි නූතන අභියෝග" මැයෙන් දේශනයක් හා දිල්ලි විශ්වවිද්‍යාලයෙන් කෙරුණු ආරාධනයක් මත "ශ්‍රී ලංකාවේ පුස්තකාලයාධිපතිත්වයේ ඓතිහාසික පැති කඩක් හා එහි නව ප්‍රවනතා" මැයෙන් දේශනයක් ද පවත්වා තිබේ.

## පොත් පරිත්‍යාග

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් 2006 වසරේ ජනවාරි - ජූනි කාලය තුළ පාසල් පුස්තකාල 60 ක්, මහජන පුස්තකාල 146 ක්, පිරිවෙන් පුස්තකාල 53 ක් හා වෙනත් පුස්තකාල 120 ක් සඳහා රු. මිලියන 2.26 ක වටිනාකමින් යුත් පොත්, පරිත්‍යාග වශයෙන් ලබා දී ඇත.

## වැඩමුළු

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පුස්තකාල ක්ෂේත්‍රය තුළ ප්‍රචලිත කරලීමේ අරමුණින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2006 වසර තුළ දී වැඩසටහන් ගණනාවක් සංවිධානය කර තිබේ. පුස්තකාල සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීමේ වැදගත්කම, WINISIS මෘදුකාංගය භාවිතයෙන් දත්ත පදනම් නිර්මාණය කිරීම හා භාවිතය, සංයුක්ත තැටි භාවිතයෙන් තොරතුරු ගවේෂණය, විද්‍යුත් තැපැල සහ අන්තර්ජාල භාවිතයෙන් තොරතුරු ගවේෂණය ආදී මාතෘකා ගණනාවක් ඔස්සේ මෙම වැඩමුළු පැවැත්වීමට කටයුතු සැලසුම් කර තිබේ. ඒ අනුව 2006 වසරේ ජනවාරි 14-21, පෙබරවාරි 23-25 සහ මාර්තු 23-24 යන දිනයන් හි විවිධ ආයතනික පුස්තකාලයාධිපතිවරුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ වැඩමුළු පවත්වා තිබේ.

# ප්‍රදර්ශනය

## සංජනනි මාධ්‍ය මංගල්‍යය හා ප්‍රදර්ශනය

කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය මගින් සංවිධානය කරනු ලැබූ සංජනනි මාධ්‍ය මංගල්‍යය හා පොත් ප්‍රදර්ශනය 2006.01.23 - 24 යන දිනයන්හි එම විශ්වවිද්‍යාලයේ දී පැවැත්විණි.

## ශ්‍රී ලංකාවේ නිදහස පිළිබඳ ප්‍රදර්ශනය

ශ්‍රී ලංකාවේ 58 වන නිදහස් දිනය සැමරීම නිමිත්තෙන් "ශ්‍රී ලංකාවේ නිදහස" අළලා රචිත පොත්පත්, සඟරා, ලිපි හා වෙනත් තොරතුරු ඇතුළත් ප්‍රදර්ශනයක් 2006 පෙබරවාරි මස 21-28 දින දක්වා ජාතික පුස්තකාල ප්‍රදර්ශනාගාරයේ දී පැවැත්විණි.

## සිංහල හින්දු අලුත් අවුරුද්ද හා ජනශ්‍රැති පිළිබඳ ප්‍රදර්ශනය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට වසර 36 ක් සහ ජාතික පුස්තකාල.හා ප්‍රලේඛන මධ්‍යස්ථානයට වසර 16 ක් සපිරීම නිමිති කොට ගෙන විශේෂ පොත් ප්‍රදර්ශනයක් 2006 අප්‍රේල් මස 27 දින සිට 2006 මැයි මස 06 දින දක්වා ජාතික පුස්තකාල ප්‍රදර්ශනාගාරයේ දී පැවත්විණ. මෙම පොත් ප්‍රදර්ශනය සඳහා සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය අළලා රචිත පොතපත, අවුරුදු සිරිත් විරිත්, ජන ක්‍රීඩා, ජන ගායනා හා ජනශ්‍රැති හා සම්බන්ධ පොත්පත්, සඟරා, පුවත්පත් ලිපි එකතු ආදී තොරතුරු මූලාශ්‍ර රැසක් එක්කොට තිබුණි.

## පර්යේෂකයන් සඳහා තොරතුරු සේවාව

ජාතික පුස්තකාලයෙහි විවිධ සම්පත් හා සේවා පිළිබඳ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල හා පර්යේෂකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක සිව්වැන්න 2006 මැයි මස 05 දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ දී පැවැත්විණ. ඒ සඳහා සමාජීය විද්‍යාපීඨයේ හා අධ්‍යාපන පීඨයේ පර්යේෂකයින් හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 60 ක් පමණ සහභාගි වූහ.

## සම්මන්ත්‍රණ

සැම වසරකම පොසොන් මාසයේ (ජුනි මාසයේ) පළමු සතියේ අඟහරුවාදා දිනට යෙදෙන පිරිවෙන් පුස්තකාල දිනය වෙනුවෙන් පුස්තකාලයාධිපතිවරුන් සඳහා එක් දින සම්මන්ත්‍රණයක් 2006 ජුනි මස 06 දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. පිරිවෙන් පුස්තකාල සේවාව හා සම්බන්ධ විවිධ තේමා යටතේ පැවති මෙම එක් දින සම්මන්ත්‍රණය සඳහා පිරිවෙන් පුස්තකාලයාධිපතිරු 68 දෙනෙක් සහභාගි වූහ.

## ජාතික ඒකාබද්ධ සූචිය පිළිබඳ වැඩමුළුව

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් පවත්වා ගෙන යනු ලබන ජාතික ඒකාබද්ධ සූචිය (National Union Catalogue) පිළිබඳව සාමාජික පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරු දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2006 ජුනි මස 13 දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පැවැත්විණ. මෙම වැඩමුළුව පැවැත්වීමේ මූලික අරමුණ වූයේ සාමාජික පුස්තකාල මගින් ජාතික ඒකාබද්ධ සූචිය සඳහා තොරතුරු

ලබාදීමේ දී මුහුණ දෙන තාක්ෂණික ගැටලු සඳහා විසඳුම් සපයා දීමයි. මෙම වැඩමුළුව සඳහා ජාතික ඒකාබද්ධ සූචියෙහි සාමාජිකත්වය දරන පුස්තකාල නියෝජනය කරමින් පුස්තකාලයාධිපතිවරු 20 දෙනෙක් සහභාගි වූ අතර සම්පත් දායකයින් වශයෙන් පුස්තකාල උපදේශක එන්.යූ.යාපා මහතා හා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා නාලනී මල්ලවආරච්චි මහත්මිය සහභාගි වූහ.

## පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සම්මන්ත්‍රණය (NACLIS) - 2006

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වාර්ෂිකව සංවිධානය කරනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික සම්මන්ත්‍රණය (NACLIS) 2006 ජූනි මස 29 කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණ. මෙම සම්මන්ත්‍රණයේ දී මෙරට පුස්තකාල ක්ෂේත්‍රය නියෝජනය කරමින් විද්වත්හු කිහිප දෙනෙක් සම්මන්ත්‍රණ පත්‍රිකා ඉදිරිපත් කළහ. ජාතික සම්මන්ත්‍රණයේ ආරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිසමේ ලේකම් ජනරාල් ප්‍රීති පෙරේරා මහතා සහභාගි විය.

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර්ෂික සමුළුව - 2006

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වාර්ෂික සමුළුව 2006 ජූනි මස 30 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී (BMICH) පැවැත්විණ. මෙම සමුළුවේ සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් තැපැල්, විදුලි සංදේශ සහ උඩරට සංවර්ධනය පිළිබඳ අමාත්‍ය දි.මු.ජයරත්න මැතිතුමා සහභාගි විය.

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 2006/2007 නිල මඬුල්ල

- සභාපති - ඩිල්මනි වර්ණසූරිය මහත්මිය
- ඉදිරි සභාපති - පියදාස රණසිංහ මහතා
- උප සභාපති - ප්‍රමීලා ගමගේ මෙනවිය
- ලේකම් - ජී.එම්. ද සිල්වා මහත්මිය
- උප ලේකම් - එච්.එන්.කේ.දිසානායක මහත්මිය
- භාණ්ඩාගාරික - ඇන්ටන් නල්ලතම්බි මහතා
- අධ්‍යාපන නිලධාරී - ශිවන්ති වීරසිංහ මහත්මිය
- සහකාර අධ්‍යාපන නිලධාරී - ඩබ්.සුනිල් මහතා
- ප්‍රකාශන නිලධාරී - ලීලාමනී අමරසේකර මහත්මිය
- තොරතුරු හා මහජන සම්බන්ධතා නිලධාරී - කේ.ජී.එස්.ගුණතිලක මහතා

## විදේශීය සමුළු

## ආසියා ශාන්තිකර කලාපීය රටවල ජාතික පුස්තකාල අධ්‍යක්ෂකවරුන්ගේ සමුළුව - 2006

ආසියා ශාන්තිකර කලාපීය රටවල ජාතික පුස්තකාල අධ්‍යක්ෂකවරුන්ගේ සමුළුව හා අග්නිදිග ආසියාතික රටවල පුස්තකාලයාධිපතිවරුන්ගේ 19 වන වාර්ෂික සමුළුව 2006 වසරේ මාර්තු මස 26 - 30 දින දක්වා පිලිපීනයේ මැනිලා නුවර දී පැවැත්විණ. මෙම සමුළු සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.එස්.පුන්‍යවර්ධන මහතා සහභාගි විය.

# செய்தி

## பயிற்சித் திட்டங்கள்

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையினால் கீழே குறிப்பிடப்பட்டுள்ள பயிற்சி நெறிகள் 2006 ஜனவரி – ஜுன் காலப் பகுதியில் நடாத்தப்பட்டன.

| பொருள் | இடமும் திகதியும் | பங்குபற்றியோர் |
|---|---|---|
| பட்டியலாக்கமும் பகுப்பாக்கமும் | கேகாலைக் கோட்டக் கல்வி அலுவலகம் 2006 மார்ச் 16-18 ஆம் திகதிகள் | கேகாலை கோட்டக்கல்வி அலுவலகத்தைச் சார்ந்த 45 ஆசிரியர்கள் |
| பொது நூலக முகாமைத்துவம் | வயம்ப பயிற்சி மத்திய நிலையம், வாரியப்பொல 2006 மே 18-20 ஆம் திகதிகள் | வடமேல் மாகாணத்தைச் சேர்ந்த 37 பொது நூலகர்கள் |
| பொது நூலக முகாமைத்துவம் | வயம்ப பயிற்சி மத்திய நிலையம், வாரியப்பொல 2006 மே 18 ஆம் திகதிகள் | வடமேல் மாகாணத்தைச் சேர்ந்த 23 சமூக அபிவிருத்தி அலுவலர்கள் |
| வாசிப்பு அபிவிருத்தி மற்றும் நூலகப் பாவனை | ஹாபிட்டிகம கல்வியியல் கல்லூரி. 2006 ஜுன் 16-18 ஆம் திகதிகள் | ஹாபிட்டிகம கல்வியியல் கல்லூரியைச் சார்ந்த 200 பயிலுநர்கள் |

## நூலக சாதனங்களைப் பேணல்

பொது நூலகங்கள் மற்றும் ஏனைய நூலகங்களில் இருந்து தெரிவு செய்யப்பட்ட ஊழியர்களின் பொருட்டு, கையெழுத்துப் பிரதிகள், நூல்கள் மற்றும் அச்சிட்ட சாதனங்களைப் பேணுதல் தொடர்பான இரு பயிற்சிப் பட்டறைகள் 2006 ஆம் ஆண்டு மார்ச் மாதம் 08-10 ஆம் திகதிகளிலும் 2006 ஆம் ஆண்டு மே மாதம் 24-26 ஆம் திகதிகளிலும் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையில் நடாத்தப்பட்டன.

## கடற்கோள் நூலக அபிவிருத்திச் செயற் திட்டம்

கடற்கோள் நூலக அபிவிருத்திச் செயற் திட்டத்தின் கீழ் கடற்கோளினால் பாதிப்படைந்த நூலகங்களையும் அவற்றின் சேவைகளையும் அபிவிருத்திச் செய்யும் நோக்கத்துடன் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையினால் பயிற்சிப் பட்டறைகள் நடாத்தப்பட்டன. இந் நிகழ்ச்சிகளை நடாத்துவதற்கு இலங்கை நூலக சங்கமும் (SLLA) நூலக தகவல் விஞ்ஞானத்திற்கான தேசிய நிறுவனமும் (NILIS) இணைந்து ஆதரவு நல்கின.

| பொருள் | இடமும் திகதியும் | பங்குபற்றியோர் |
|---|---|---|
| பொது நூலக முகாமைத்துவம் | தேசிய நூலக கேட்போர் கூடம். 2006 ஏப்பிரல 06-08 ஆம் திகதிகள் | மேல் மாகாணம் மற்றும் தென் மாகாணத்தைச் சேர்ந்த பொது நூலகர்கள் |
| பாடசாலை நூலக நூலக சேவைகள் நிறுவனங்கள் | தகவல் விஞ்ஞானத்திற்கான தேசிய நிறுவனம் | பாடசாலை நூலகர்கள் |
| பொது நூலக முகாமைத்துவம் | தேசிய நூலக கேட்போர் கூடம். 2006 மே 03-05 ஆம் திகதிகள் | வட கிழக்கு மாகாணம் பொது நூலகர்கள் (தமிழ் மொழி மூலம்) |
| நூலக சேவைகள் தேசிய நிறுவனங்கள் | நூலக கேட்போர் கூடம். 2006 மே 08-10 ஆம் | பொது நூலகங்களின் நூலக உதவியாளர்கள் (சிங்கள |

| | | |
|---|---|---|
| | திகதிகள் | மொழி மூலம்) |
| நூலக முகாமைத் தேசிய துவம் | நூலக கேட்போர் கூடம். 2006 மே 17-18 ஆம் திகதிகள் | பொது, பாடசாலை நூலகங் கள் தவிர்ந்த ஏனைய நூல கங்களின் ஊழியர்கள் |
| நூலக சேவைகள் NILIS நிறுவனங்கள் | 2006 மே 25-26 ஆம் திகதிகள் | வட கிழக்கு மாகாணத்தைச் சேர்ந்த நூலக உதவியாளர் கள் |

## கடற்கோள் நூலகங்களுக்கு நூலகத் தளபாடங்கள்

கடற்கோள் அனர்த்தத்தினால் பாதிப்படைந்த நூலகங்களுக்கு தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் அநுசரணையுடன் வழங்கப்பட்டஒரு மில்லியனை வீட கூடுதலான பெறுமதியான தளபாடங்கள் 2006 ஆம் ஆண்டின் முதல் ஆறுமாத காலப்பகுதியில், ஒன்பது (09) நூலகங்களிடையே பகிர்ந்து வழங்கப்பட்டன. பாணந்துறை வெல்லபட கிளை நூலகம், பேருவளை மருதானைக் கிளை நூலகம், கத்தமுவ பொது நூலகம், அம்பலங்கொடை-ஹிரேவத்தை கிளை நூலகம், பொத்துவில் - கோமாரிப் பொது நூலகம், பொத்துவில் - சின்ன உல்லைப் பொது நூலகம், அட்டாளைச்சேனைப் பொது நூலகம் - அட்டாளைச்சேனை, ஓலுவில் பொது நூலகம், நாவலடி கிளை நூலகம் என்பனவே அந் நூலகங்களாகும். கதிரைகள், மேசைகள், நூற் தட்டுக்கள், நூற் கபினற்றுக்கள், விறாந்தைக் கதிரைகள், புதினத்தாட் தட்டுக்கள் என்பன அன்பளிப்புச் செய்த தளபாடங்களுள் அடங்கும்.

## நூலகங்களை தரநிர்ணயும் செய்யும் செயற்திட்டம்

தேசிய நூலக ஆவணவாக்கற் சேவைகள் சபையானது தனது நூலகங்களைத் தரநிர்ணயம் செய்யும் செயற் திட்டத்தின் கீழ் ஒன்பது (09) பாடசாலை நூலகங்களை தரம் 1 நூலகங்களாகத் தரமுயர்த்தியுள்ளது. அந் நூலகங்களின் விபரம் பின்வருமாறாகும்.

- மயுரபால மத்திய கல்லூரி நூலகம், குருநாகல்
- இப்பாகமுவ மத்திய கல்லூரி நூலகம், இப்பாகமுவ
- சந்தலங்காவ மத்திய கல்லூரி நூலகம், சந்தலங்காவ
- ஏஸ்.டபிள்யு.ஆர்.டீ.பண்டாரநாயக்கா தேசிய பாடசாலை நூலகம், குளியாபிட்டிய
- டீ. டிஸ். சேநாநாயக்க கல்லூரி நூலகம், கொழும்பு
- றோயல் கல்லூரி நூலகம், கொழும்பு
- பம்பலப்பிட்டி இந்துக் கல்லூரி நூலகம், கொழும்பு
- பண்டாரநாயக்க மத்திய கல்லூரி நூலகம், கம்பஹா
- ஸ்ரீ பராக்கிராமபாகு தேசிய பாடசாலை நூலகம், நிக்கவரெட்டிய

## நூல் அன்பளிப்புகள்

தேசிய நூலக ஆவணவாக்கற் சேவைகள் சபையானது 2006 ஆம் ஆண்டின் முதல் ஆறு மாத காலப் பகுதியினுள் ரூபா 2.26 மில்லியன் பெறுமதியான நூல்களை அன்பளிப்புச் செய்துள்ளது. அவற்றின் விபரம் பின்வருமாறாகும்.

- பாடசாலை நூலகங்கள் 60
- பொது நூலகங்கள் 146
- பிரிவேனா நூலகங்கள் 53
- ஏனைய நூலகங்கள் 120

## 58 ஆவது சுதந்திர தினக் கண்காட்சி

இலங்கையின் 58 ஆவது சுதந்திர தினத்தைக் கொண்டாடுமுகமாக தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை "இலங்கையின் சுதந்திரம்" என்னும் தலைப்பின் கிழ் கண்காட்சி ஒன்றை 2006 ஆம் ஆண்டு பெப்ரவரி மாதம் 2 ஆம் திகதியில் இருந்து 28 ஆம் திகதி வரை நடாத்தியது. இக் கண்காட்சியானது இலங்கையின் சுதந்திரம் தொடர்பான பெருமளவிலான நூல்களையும், பருவ வெளியீடுகளையும் ஏனைய தகவல்களையும் கொண்டிருந்தது.

## பிரிவேனா நூலக தினம்

பிரிவேனா நூலக தினத்தைக் (ஜுன் மாதத்தின் முதலாவது செவ்வாய்க்கிழமை) கொண்டாடுமுகமாக தேசிய நூலக ஆவணவாக்கற் சேவைகள் சபை பிரிவேனா நூலகர்களுக்காக மாநாடு ஒன்றை 2006 ஆம் ஆண்டு ஜுன் மாதம் 06 ஆம் திகதி தேநூஆசேச யின் கேட்போர் கூடத்தில் ஒழுங்கு செய்திருந்தது. இம்மாநாட்டில் 68 பயிலுநர்கள் பங்குபற்றினர்.

## தேசிய ஒழுங்கிணைந்த பட்டியல் தொடர்பான பயிற்சிப் பட்டறை

தேசிய ஒழுங்கிணைந்த பட்டியல் தொடர்பான பயிற்சிப் பட்டறை ஒன்று 2006 ஆம் ஆண்டு ஜுன் மாதம் 13 ஆம் திகதி தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தில் (NLDC) நடாத்தப்பட்டது. இப் பயிற்சிப் பட்டறையின் பிரதான நோக்கம் தேசிய ஒழுங்கிணைந்த பட்டியலுக்கு பங்களிப்புச் செய்யும் நூலகங்கள் தரவுகளை அனுப்புவதில் எதிர் நோக்கும் தொழில் நுட்பச் சிக்கல்களை நிவர்த்தி செய்வதேயாகும். இப் பயிற்சிப் பட்டறையில் பங்களிப்புச் செய்யும் நூலகங்களைச் சேர்ந்த 20 நூலகர்கள் பங்குபற்றினர்.

## நூலகத் தகவற் கற்கை தொடர்பான தேசிய மாநாடு (NACLIS) 2006

இலங்கை நூலக சங்கமானது நூலகத் தகவற் கற்கை தொடர்பான தேசிய மாநாடு (NACLIS) ஒன்றை 2006 ஆம் ஆண்டு ஜுன் மாதம் 29 ஆம் திகதி கொழும்பு BMICH இல் நடாத்தியது. இவ் ஆரம்ப விழாவின் பிரமத விருந்தினராக UNESCO விற்கான இலங்கை தேசிய ஆணைக் குழுவின் பொது செயலாளரான திரு. பிரீத்தி பெரேரா அவர்கள் அழைக்கப்பட்டிருந்தார்.

## இலங்கை நூலக சங்கத்தின் வருடாந்தப் பொதுக் கூட்டம் - 2006

இலங்கை நூலக சங்கத்தின் வருடாந்தப் பொதுக் கூட்டம் (AGM) கொழும்பு, BMICH இல் 2006 ஆம் ஆண்டு ஜுன் மாதம் 30 ஆம் திகதி நடாத்தப்பட்டது. இதன் பிரதம விருந்தினராக தபாற் தொலைத் தொடர்பு மற்றும் மலையக அபிவிருத்தி அமைச்சர் கௌரவ டீ. டிம். ஜயரத்ன அவர்கள் கலந்து கொண்டார்கள்.

## SLLA யின் 2006-2007 இற்கான நிருவாகக் குழு

| | |
|---|---|
| • தலைவர் | திருமதி டில்மினி வர்ணசூரிய |
| • தலைவர் தெரிவு | திரு. பியதாச ரணசிங்ஹ |
| • பிரதித் தலைவர் | செல்வி. பிரமிளா கமகே |
| • பொதுச் செயலாளர் | திருமதி. ஜி. எம். த சில்வா |
| • முன்னையநாள் தலைவர் | திருமதி. தீபாலி தலகல்ல |
| • காசாளர் | திரு. அன்ரன் நல்லதம்பி |
| • கல்வி அலுவலர் | திருமதி. சிவந்தி வீரசிங்ஹ |
| • உதவிக் கல்வி அலுவலர் | திரு. டபிள்யு. சுனில் |
| • உதவிச் செயலாளர் | திருமதி. ஏச். ஏன். கே. திசாநாயக்க |
| • வெளியீட்டு அலுவலர் | திருமதி. லிலாமணி அமரசேகர |
| • தகவல் மற்றும் பொதுசனத் தொடர்பு | திரு. கே. ஜி. எஸ். குணத்திலக்க |
| • பிரேரிக்கப்பட்ட அங்கத்தவர் | திருமதி. ஐரா முதநாயக்க |
| • | திருமதி. வத்மானல் செனவிரத்ன |

## சர்வதேச மாநாடுகள்

ஆசியா மற்றும் ஓசானியாவின் தேசிய நூலகங்களின் பணிப்பாளர்களுக்கான (CDNLO) மாநாடும், தென்னாசிய நூலகர்களின் காங்கிரஸின் (CONSAL) பத்தொன்பதாவது மாநாடும் பிலிப்பைன்சின் மணிலாவில் 2006 ஆம் ஆண்டு மார்ச் மாதம் 26-30 ஆம் திகதிகளில் நடாத்தப்பட்டது. இம் மாநாடுகளில் தேநூஆசே சபையின் பிரதிப் பணிப்பாளர் திரு. டபிள்யு. எஸ். புண்ணியவர்தன கலந்து கொண்டார்.

# News

## Training Programmes

Following training programmes were conducted by the National Library and Documentation Services Board during January – June 2006.

| Theme | Place and Date | Participation |
|---|---|---|
| Cataloguing and Classification (School Library) | Kegalle Zonal Education Office from 16-18 March 2006 | 45 Teacher Librarians in Kegalle Zonal Education |
| Library Management (Public Library) | Wayamba Training Centre Wariyapola from 18-20 May 2006 | 37, Public Librarians in North Western Province |
| Library Management (Public Library) | Wayamba Training Centre Wariyapola from 18 May 2006 | 23, Community Development Officers in North Western Province |
| Reading Promotion and Library Usage | Hapitigama College of Education from 16-18 June 2006 | 200 trainers were participated |

## Preservation of Library Materials

Two workshops on preservation of manuscripts, books and other printed materials were held at the NLDSB from 08th – 10th March 2006 and 24th –26th May 2006 for some selected library staff of public libraries and other libraries.

## Tsunami Library Development Programme

Under the Tsunami Library Development Programme, the NLDSB conducted the training programmes for upgrading Tsunami affected libraries & their services. Sri Lanka Library Association (SLLA) and National Institute of Library and Information Sciences (NILIS) were jointly supported for conducting these programmes.

| Theme | Place and Date | Participation |
|---|---|---|
| Public Library Management | National Library Auditorium from 06th – 08th April 2006 | Librarians of Public Libraries in Western and Southern Province |
| School Library Services Organisation | National Institute of Library and Information Sciences (NILIS) from 03rd – 05th May 2006. | School Librarians |
| Public Library Management | National Library Auditorium from 03rd-05th May 2006 | Librarians of the North and Eastern Province (Tamil Medium) |
| Library Services Organisation | National Library Auditorium from 08th-10th May 2006 | Library Assistants of the Public Libraries (Sinhala Medium) |

| | | |
|---|---|---|
| Library Management | National Library Auditorium 17th-18th May 2006 | Other Library Staff except Public and School Libraries |
| Library Services Organisation | NILIS from 25th-26th May 2006 | Library Assistants of the North and Eastern Province |

## Library Furniture for Tsunami Libraries

The programme of donating library furniture for the Tsunami affected Libraries which was sponsored by the NLDSB has donated more than one millions worth of furniture sets among nine (09) libraries within first six month of the year 2006. The libraries such as Panadura Wellabada Branch Library, Beruwela Maradana Branch Library, Kathaluwa Public Library of Hirewatta Branch Library - Ambalangoda, Komari Public Library - Pothuvil, Vinnaulai Public Library – Pothuvil, Addalachchenei Public Library – Addalachchenei, Oluvil Public Library and Nawaladi Branch Library. Chairs, Tables, Book Racks, Book Cabinets, Veranda Chairs and Newspaper Racks were included for a furniture set.

## Library Grading Programme

NLDSB under it's library grading programme has upgraded nine (09) School Libraries as the grade one libraries. The list of libraries are as follows.

- Mayurapada Central College Library, Kurunegala
- Ibbagamuwa Central College Library, Ibbagamuwa
- Sandalankawa Central College Library, Sandalankawa
- S.W.R.D.Bandaranayake National School Library, Kuliyapitiya
- D.S.Senanayake College Library, Colombo 08
- Royal College Library, Colombo 07
- Hindu College Library, Bambalapitiya
- Bandaranayake Central College Library, Gampaha
- Sri Parakramabahu National School Library, Nikaweratiya

## Book Donations

Rs. 2.26 million worth of books were donated during the first 6 month of the year 2006 by the NLDSB.

| | | |
|---|---|---|
| ♦ School Libraries | - | 60 |
| ♦ Public Libraries | - | 146 |
| ♦ Pirivena Libraries | - | 53 |
| ♦ Other Libraries | - | 120 |

## 58th Independence Day Exhibition

To the mark of the 58th Independence Day of Sri Lanka, the NLDSB has conducted an exhibition namely "Independence in Sri Lanka" from 21st – 28th February 2006. There was a large number of books, periodical articles and other information about the Independence in Sri Lanka at the exhibition.

## Promotion on National Library

NLDSB has conducted another programme of promoting National Library and it's services among the researchers and academic staff at the Open University of Sri Lanka on 05th May 2006.

## Pirivena Library Day

To mark the Pirivena Library Day (1st Tuesday of June), the NLDSB conducted a seminar for pirivena librarians on 6th June 2006 at the NLDSB auditorium. There were 68 participants at this seminar.

## Workshop on National Union Catalogue

A workshop on National Union Catalogue was held on 13th June 2006 at the National Library and Documentation Centre (NLDC). The main objective of this workshop is to resolve the technical problems encountered in sending data to the National Union Catalogue by subscribing libraries. Librarians of 20 subscribing libraries were participated at this workshop.

## National Conference on Library and Information Studies (NACLIS) 2006

The Sri Lanka Library Association conducted the National Conference on Library and Information studies (NACLIS) on 29th June 2006 at the BMICH, Colombo. The chief guest in the inauguration ceremony was Mr.Preethi Perera, Secretary General, Sri Lanka National Commission for UNESCO.

## The Annual General Meeting of the Sri Lanka Library Association – 2006

The Annual General Meeting (AGM) of the Sri Lanka Library Association was held on 30th June 2006 at the BMICH, Colombo. Hon D.M.Jayarathne, Minister of Post Telecommunications and Udarata Development was the chief guest.

## The Council Members of the SLLA 2006/2007

- President - Ms. Dilmani Warnasooriya
- President Elect - Mr.Piyadasa Ranasinghe
- Vice President - Ms. Premila Gamage
- General Secretary - Ms.G.M.de Silva
- Assistant Secretary - Ms. H.N.K.Dissanayake
- Treasurer - Mr.Anton Nallathamby
- Education Officer - Ms.Shivanthi Weerasinghe
- Assistant Education Officer - Mr.W.Sunil
- Publication officer - Ms.Lilamani Amarasekera
- Information and Public Relations Officer - Mr. K.G.S.Gunathilaka

## International Conferences

## The CDNLO Meeting and the CONSAL – 2006

The conference of directors of National Libraries in Asia and Oceania (CDNLO) and the Nineteenth General Conference of the congress of Southeast Asian Librarians (CONSAL) was held from 26th –30th March 2006 in Manila, Philippines. Mr.W.S.Punyawardana, Deputy Director of the NLDSB participated the conference.

# සම්පත් පාදක අධ්‍යාපනය සහ තොරතුරු කුසලතා

(ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ ගුරු පුස්තකාලයාධිපතිගේ කාර්යභාරය යන තේමාව යටතේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා 2004.06.12 වන දින පැවති සම්මන්ත්‍රණය වෙනුවෙන් පවත්වන ලද දේශනයකි)

පද්මා බණ්ඩාරනායක
පුස්තකාලයාධිපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## හැඳින්වීම

තොරතුරු යනු ලබන්නාට යමකිසි දැනුමක් පණිවිඩයක් ලබා ගත හැකි ලෙස සංවිධානය කරන ලද දත්ත සමූහයක් ලෙස සරලව නිර්වචනය කළ හැක. තවද, තොරතුරු වාචික, ලිඛිත, ශ්‍රව්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය හා ඉලෙක්ට්‍රොනික යන මාධ්‍යයන් හරහා බෙදා හැරීමේ හැකියාව ඇත. තොරතුරු අද රටක හෝ සමාජයක සංවර්ධනය මැනීමේ තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (Information and Communication Technology - ICT) බිහිවීමත් සමග තොරතුරු නිෂ්පාදනය, පිරිසැකසීම, ගබඩාකරණය, භාවිතය හා බෙදා හැරීම වඩාත් විධිමත් මෙන්ම කාර්යක්ෂම වී ඇත. එබැවින් මෙම යුගය තොරතුරු යුගයක් (Information Age) ලෙස හඳුන්වන අතර අද අප ජීවත් වන සමාජය තොරතුරු සමාජයක් (Information Society) ලෙස හඳුන්වයි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ (ICT) ප්‍රබලත්වය හේතුවෙන් අද තොරතුරු සුලබත්වය හෙවත් අවශ්‍ය පමණට වඩා තොරතුරු බිහිවීම එනම් තොරතුරු පුපුරායාම (Information Explosion) යන ගැටලුවට ද අපට මුහුණ පෑමට සිදුව ඇත. විවිධ මාධ්‍ය ඔස්සේ තොරතුරු බිහිවීම මෙම ගැටලුව වඩාත් උග්‍රකර ඇත. තවද එසේ අති සුලබව අන්තර්ජාලය වැනි ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ නිරන්තරව ලැබෙන තොරතුරුවල ගුණාත්මක බව හෙවත් නිරවද්‍යතාව පිළිබඳව ද ගැටලු පවතී. එමෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බලපෑම හේතුවෙන් තවත් ගැටලුවක් ඉස්මතුව ඇත. එනම් මෙම තාක්ෂණය හේතුවෙන් තොරතුරු වෙත එළඹීමේ හැකියාව අඩු පහසුකම්වලින් යුත් ප්‍රදේශවල ජනතාව වෙත ලබා දීම අහුරා ඇත. මෙය ඩිජිටල් ඩිවයිඩ් (Digital Divide) නම් වේ. විවිධ මාධ්‍ය බිහිවීමත්, විෂය පථයන් පුළුල් වීමත් සමඟම පාඨක තොරතුරු අවශ්‍යතා ද තරමක් සංකීර්ණ වී ඇත. මෙම ගැටලුවලින් මිදීම හෝ ගැටලු අවම කරවීම අද පුස්තකාල වෘත්තියේ යෙදී සිටින්නන්ට මුහුණ දීමට සිදුව ඇති බලවත් අභියෝගයකි.

තොරතුරු පුපුරායාම හෙවත් තොරතුරු සුලබත්වය හමුවේ පාඨකයාට තම තොරතුරු අවශ්‍යතාවට ගැලපෙන නිවැරදි තොරතුරු තෝරා බේරා ගැනීම තරමක් දුෂ්කර කටයුත්තක් වී ඇත. ඒ සඳහා සෑම පාඨකයෙකු විසින්ම වර්ධනය කරගත යුතු කුසලතා රැසකි. එම කුසලතා වර්ධනය කරලීමට අවශ්‍ය කටයුතු යෙදීම සෑම වර්ගයකම පුස්තකාලයාධිපතිවරයෙකුගේ ප්‍රබල වගකීමක් වේ. පාසල් අධ්‍යාපනයේ දී ද කුඩා කල සිට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙකී තොරතුරු කුසලතා වර්ධනය කර ගත හැකි වන පරිදි විෂය නිර්දේශ සැකසීමත්, ඒ සඳහා විදුහල්පති ඇතුළු ගුරු මණ්ඩලය ඉගෙනීම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමත්, එම ක්‍රියාවලිය සඳහා පාසල් පුස්තකාලයාධිපතිගේ සහයෝගය ලබා ගැනීමත් අත්‍යවශ්‍ය වේ. සමස්ත පාසල් සමාජයම එක් වී මේ සඳහා කටයුතු කිරීම ජාතික කර්තව්‍යයක් බවට පත්ව ඇත.

## තොරතුරුවල වැදගත්කම

සෑම පුද්ගලයෙකුටම දෛනික ජීවිතයේ මෙන්ම අධ්‍යාපනික හා වෘත්තීය ජීවිතයේ දී විවිධ තොරතුරු අවශ්‍යතා පැන නගී. එනම්, තීරණ ගැනීමට, මනාසේ සන්නිවේදනය කිරීමට, දැනුම හා බුද්ධි වර්ධනයට, ආකල්පමය වෙනසක් සඳහා මෙන්ම යම් ගැටලුවකට පිළිතුරු සොයා ගනිමින් අවිනිශ්චිත භාවයෙන් මිදීමට ආදී වශයෙන් තොරතුරු අවශ්‍ය වේ. තවද, අවශ්‍ය විට අවශ්‍ය තොරතුරු ලබන පුද්ගලයා තමාට ලැබිය යුතු වරප්‍රසාද හා අනෙකුත් වාසි සහගත අවස්ථාවලින් නිසි ප්‍රයෝජන ලබනු ඇත. එසේම නිවැරදි තොරතුරු අදාළ පුද්ගලයාට නිසි කලට වඩාත්ම උචිත මාධ්‍යයෙන් ලැබීම ඉතා වැදගත් වේ.

## සම්පත් පාදක අධ්‍යාපනය

සම්පත් පාදක අධ්‍යාපනයේ දී තොරතුරු ප්‍රබල දායකත්වයක් සපයයි. සම්පත් පාදක ඉගෙනුම යනු විවිධ සම්පත්වලට පාත්‍රවීම සහ අභ්‍යාසය හරහා විෂය සහ තොරතුරු පරමාර්ථයන් ඉටුකර ගැනීමය. මෙහි ඉලක්කය වනුයේ පාසල තුළ ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයක් බිහි කිරීමයි. මෙහි අත්‍යවශ්‍ය ලක්ෂණ වනුයේ,

★ විවිධ ඉගෙනුම් ශෛලියනට සහ විෂය ක්ෂේත්‍රයනට හැඩ ගැසීමේ නම්‍යතාව ඇති කිරීම

★ ශිෂ්‍යයින්ගේ ස්වාධීනතාව ප්‍රවර්ධනය කිරීම

මෙහිදී සාම්ප්‍රදායානුකූල ගුරුවරයා කේන්ද්‍රීය කොට ගත් අධ්‍යාපනික ක්‍රමයකට වඩා ශිෂ්‍යයා කේන්ද්‍ර කොටගත් අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍ය බව තහවුරු කොටගෙන ඇත.

## තොරතුරු සාක්ෂරතාව (Information Literacy) යනු කුමක්ද?

සරලව ගතහොත් මෙය තොරතුරු කුසලතාව (Information Skills) හෝ පුස්තකාල භාවිතයේ කුසලතාව (Library Skills) ලෙස අර්ථ දැක්විය හැක. තොරතුරු කුසලතා සහිත වීම හේතුවෙන් විවිධ වූ මූලාශ්‍ර ඇසුරින් තම තොරතුරු අවශ්‍යතා (Information Needs) සපුරා ගැනීමත්, තොරතුරු භාවිත කිරීම, ඉදිරිපත් කිරීම හා තොරතුරු ඇගයීමේ හැකියාව, තොරතුරු සාක්ෂරතාව ලෙස සරලව හැඳින්විය හැක. මෙම සංකල්පය පිළිබඳ පළමුව සාකච්ඡාවට බඳුන් වූයේ 70 දශකයේ දීය. මේ සම්බන්ධව පර්යේෂණ සිදු කරන ක්‍රිස්ටිනා ඩොයිල් පවසන පරිදි තොරතුරු සාක්ෂරතාව යනු විවිධ මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගැනීම, ඇගයීම හා භාවිතයේ හැකියාවයි.

*"Information Literacy is the ability to access, evaluate and use information from a variety of sources"*

ආචාර්ය රෝස් ටොඩ්ට අනුව තොරතුරු සාක්ෂරතාව යනු අර්ථවත් ලෙස හා ඵලදායී ලෙස තොරතුරු භාවිතයේ හැකියාවයි.

*"Information Literacy is the ability to use information purposefully and effectively"*

අමෙරිකානු පුස්තකාල සංගමයේ (American Library Association) අර්ථ දැක්වීමට අනුව තොරතුරු සාක්ෂරතාව සහිත පුද්ගලයා (Information Literate) යනු තොරතුරු අවශ්‍යතාවක් ඇති වූ විට එය හඳුනා ගැනීමේ හැකියාව මෙන්ම එය ඉටු කර ගැනීම සඳහා තොරතුරු සොයා ගැනීමට, ඇගයීමට හා ඵලදායී ලෙස භාවිතයට හැකියාව සතු පුද්ගලයෙකි. එනම් තොරතුරු සාක්ෂරතාව සහිත පුද්ගලයන් යනු ඉගෙනීමට ඉගෙනගත් පුද්ගලයන්ය. ඔවුන් තොරතුරු සංවිධානය කර ඇති ආකාරයත්, තොරතුරු සොයා ගන්නා අයුරු, එමෙන් ම තොරතුරු උචිත ආකාරයට භාවිත කරන අයුරුත් පිළිබඳ මනා දැනීමක් ඇති හෙයින් ඉගෙනීමට ඉගෙනගත්තවුන් (Life-long Learners) ලෙස හඳුන්වයි.

*"To be information literate, a person must be able to recognise when information is needed and have the ability to locate, evaluate, and use effectively the information needed. Ultimately information literate people are those who have learned how to learn. They know how to learn because they know how information is organised, how to find information, and how to ues information in such a way that others can learn from them."* (www.ala.org)

ක්‍රිස්ටීන් බෲස් (Christine Bruce) විසින් එකිනෙක හා තදින් සම්බන්ධව පවතින තොරතුරු සාක්ෂරතාවයේ මුහුණුවර පහක් පැහැදිලි කර ඇත. එනම්, තොරතුරු තාක්ෂණ කුසලතා, පරිගණක කුසලතා, පුස්තකාල කුසලතා, තොරතුරු කුසලතා හා යාවජීව අධ්‍යාපනයට ඉගෙනීම.

තොරතුරු සොයා යාමේදී ඕනෑම පුද්ගලයෙකු පසු කරන අවස්ථා හයක් පිළිබඳව අයිසෙන්බර්ග් හා බර්කෝවිට්ස් විසින් 1990 දී පැහැදිලි කර ඇත (Eisenberg and Berkowitz). එම පියවර හය පහත දක්වා ඇති පරිදි වේ.

1. Task Definition - තම කාර්ය මනාව නිර්වචනය කර ගැනීම - එනම් තොරතුරු අවශ්‍යතාව හඳුනා ගැනීම හා පැහැදිලිව ප්‍රකාශ කිරීමේ හැකියාව
2. Information Seeking Strategies - තොරතුරු ගවේෂණ ක්‍රමෝපායන් අනුගමනය කිරීම, ප්‍රමුඛතාව දියයුතු කරුණු හා විවිධ තොරතුරු මූලාශ්‍ර පිළිබඳ අවබෝධය
3. Locate & Access - අවශ්‍ය තොරතුරු ඇති ස්ථාන හඳුනා ගැනීම හා තොරතුරු අත්පත් කර ගැනීම
4. Information Use - තොරතුරු භාවිතය (කියවීම, පිටපත්කරණය)
5. Synthesis - තොරතුරු සංස්ලේෂණය (සංවිධානය හා ඉදිරිපත් කිරීම)
6. Evaluation - තොරතුරු ඇගයීම (නිමවුම් ඵලය හා ගවේෂණ ක්‍රියාවලිය පිළිබඳ ඇගයීම)

ඉහත සඳහන් අවස්ථා හය පසුකරලීමේ දී තොරතුරු කුසලතා වර්ධනය කර තිබීම පාඨකයෙකුට බොහෝ වාසි ඇති කරයි. එනම්, දිගු ලිපියක් හෝ ග්‍රන්ථයක් සම්පූර්ණයෙන් කියවීමෙන් තොරව එහි මාතෘකා අනුමාතෘකා, පටුන පිටු ආදිය ඇසුරෙන් එම මූලාශ්‍රයේ අදාළත්වය පිළිබඳ ක්ෂණිකව අවබෝධ කරගත හැකි හෙයින් පාඨකයාගේ කාලය බොහෝ සෙයින් ඉතිරි කර ගත හැකිය. මේ සඳහා අවශ්‍යවන්නා වූ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කර තිබීම බෙහෙවින් අවැසි වේ. පෙනී මුවර්ගේ (Penny Moore) අදහසට

අනුව සිතීමේ ශක්තිය, ප්‍රශ්න කිරීමේ හැකියාව හා මනසින් ඇගයීමේ හැකියාව තිබීමත් ගැටලුවක් නිරාකරණයට අවශ්‍ය තොරතුරු සොයා යෑමේ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වේ.

මෙහිදී කවදා කවර තොරතුරක් අවශ්‍යදැයි හඳුනා ගැනීම පාඨකයාට ක්ෂණිකව තොරතුරු ලබා ගැනීමට ඉවහල් වේ. තවද පුස්තකාලවල ඇති සම්පත් වෙත එළඹීමේ විවිධ මාර්ගත්, විවිධ ගවේෂණ ක්‍රමෝපායන්ද හඳුනා ගෙන තිබීම වැදගත්ය. තවද, මුවර්ට අනුව කවර පුස්තකාලයන් හි එම තොරතුරු ඇත්ද යන්න පමණක් නොව විවිධ පුද්ගලයන්ගෙන් හා පරිගණක භාවිතයෙන් තොරතුරු ලබා ගැනීමට ඇති කුසලතා වර්ධනය කර තිබීමත් වැදගත්ය. 1987 වර්ෂයේ දී කැරොල් කුල්තාහු (Carol Khulthau) විසින් ද තොරතුරු ගවේෂණ පියවර හයක් හා ඒ ඒ පියවරයේ දී පාඨකයා පසුවන හැඟීම් පිළිබඳවත් සාකච්ඡා කොට තිබිණ. ඇයට අනුව යම්කිසි කාර්යයක් හෝ පර්යේෂණයක් ආරම්භ කරන අවස්ථාවේ දී අවිනිශ්චිත හැඟීමකින් පසුවන තොරතුරු සොයා යන්නා තොරතුරු සොයා ගත් පසු යම්කිසි සුබවාදී සිතුවිල්ලක් හා අස්වැසිල්ලක් ලබයි.

කෙසේ වෙතත් තොරතුරු සාක්ෂරතාව යනු ප්‍රවේශමෙන් හැසිරවිය යුතු එසේ නොමැති නම් ආන්දෝලනයට තුඩු දෙන සංකල්පයක් ලෙස ද මුවර් විසින් හඳුන්වා ඇත. තවද බ්‍රෙන්ඩා ඩර්වින් (Brenda Derwin) නම් තොරතුරු විද්‍යාඥවරිය විසින් ද පුද්ගලයෙකු තොරතුරු සොයා යන අවස්ථාව පිළිබිඹු වන ආකාරය චිත්‍රයකින් විස්තර කර ඇත. ඒ අනුව පුස්තකාලයාධිපති හෝ ගුරුවරයා විසින් පාඨකයාගේ තොරතුරු අවශ්‍යතාව හෙවත් දැනට ඔහු/ඇය සතුව ඇති තොරතුරු හා අවශ්‍ය කරන තොරතුරු අතර පරතරය කවරේදැයි හඳුනා ගෙන එම පරතරය අවම කරවීමට/පියවීමට අවශ්‍ය තොරතුරු ලබා දීමට පුස්තකාලයාධිපති කටයුතු කළ යුතුය.

පාසලේ ඉලක්ක ජයගැනීම උදෙසා තොරතුරු සාක්ෂරතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් තොරතුරු කුසලතා වර්ධනයට ප්‍රබල දායකත්වයක් සිදුවෙනු ඇත. එමෙන් ම ගුරුවරුන්ට වඩාත් සුදුසු ඉගැන්වීමේ ක්‍රම හඳුනා ගැනීමටත්, පුස්තකාලයාධිපති හා ගුරුවරු අතර අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කිරීමටත් මෙම වැඩසටහන් මහත් රුකුලක් වනු ඇත. ඒ සඳහා පිළිගත් තොරතුරු ආකෘතියකට අනුව සිසුන් මෙහෙයවීම පාසල් සමාජයේ ම වගකීම ලෙස සඳහන් කළ හැක.

පාසල්හි සම්පත් පාදක අධ්‍යාපනයේ දී ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තොරතුරු සාක්ෂරතාව හෙවත් තොරතුරු කුසලතා ගුරුවරුන් හා ශිෂ්‍යයින් විසින් වර්ධනය කර තිබීමේ අවශ්‍යතාව මේ අනුව මනාව පැහැදිලි වේ. එපමණක්නොව පාසල් සමාජයේ සියලු භූමිකාවන් රඟ දක්වන සැම විසින් තොරතුරු කුසලතා වර්ධනය කර තිබීම හේතුවෙන් වඩාත් දැනුවත් සමාජයක් අපේක්ෂා කළ හැක. මේ සඳහා වර්ධනය කර තිබිය යුතු කුසලතා පහත දක්වා ඇති පරිදි විස්තර කළ හැක.

## තොරතුරු සාක්ෂරතාව සහිත පුද්ගලයෙකු සතු කුසලතා සහ ලක්ෂණ

★ තම තොරතුරු අවශ්‍යතාව කවරේදැයි පැහැදිලිව හඳුනා ගැනීමේ හැකියාව
★ ඒ සඳහා අවශ්‍යවන තොරතුරු ප්‍රමාණය පිළිබඳ අවබෝධය
★ එසේ තම තොරතුරු අවශ්‍යතාව ඉටු කරගත හැකි පරිදි විවිධ වර්ගයේ මූලාශ්‍ර කරා යොමු වීමේ හැකියාව. මෙහි දී ප්‍රාථමික, ද්විතීයික හා තෘතියික තොරතුරු මූලාශ්‍රවලින් තම අවශ්‍යතාවට ගැලපෙන පරිදි තොරතුරු උකහා ගැනීමේ හැකියාව (සාරාංශ ගත කරගැනීම, නිර්වචනය හෝ තේරුම සොයා ගැනීම ආදී ලෙස)
★ අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි විවිධ මාධ්‍ය පිළිබඳ අවබෝධය (වාචික, ලිඛිත, ශ්‍රව්‍ය, ශ්‍රව්‍ය-දෘශ්‍ය හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය)
★ පර්යේෂණයක් සිදු කිරීමේ දී සැලැස්මක් සැකසීමේ හැකියාව
★ විවිධ ගවේෂණ පද්ධති භාවිතයේ හැකියාව (සූචි කාඩ්පත්, පරිගණක සූචි ආදිය)
★ වඩාත්ම සුදුසු තොරතුරු ගවේෂණ ක්‍රම (Search Strategies) හා තොරතුරු නිරාවරණ ක්‍රම (Re trieval Strategies) හඳුනා ගැනීම මෙන්ම නිවැරදි හා උචිත ගවේෂණ මාර්ග යොදා ගැනීම (උදා: පුස්තකාල සූචි, අනුක්‍රමණිකා හා ග්‍රන්ථ නාමාවලි හරහා තොරතුරු නිරාවරණය කර ගැනීමේ හැකියාව)
★ විවිධ වර්ගීකරණ ක්‍රම භාවිතයේ හැකියාව (ඇමතුම් අංක ආදිය පිළිබඳ අවබෝධය)
★ පර්යේෂණ තොරතුරු ලබා ගන්නා විවිධ ක්‍රම හඳුනා ගැනීම - සාහිත්‍ය ගවේෂණය, පාඨක සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා මෙහෙයවීම ආදිය
★ අවශ්‍ය තොරතුරු ගබඩා කර හෝ පිටපත් කර තබා ගැනීමේ හැකියාව
★ විවිධ මාධ්‍ය උපයෝගී කරගනිමින් තොරතුරු සන්නිවේදනය කිරීමේ හැකියාව හා පිරිසැකසීමේ හැකියාව
★ ලබාගත් තොරතුරු විශ්ලේෂණය කිරීමේ හැකියාව
★ තොරතුරුවල නිරවද්‍යතාව, අදාළ බව ආදී කරුණු පිළිබඳ ඇගයීමේ හැකියාව සහ තොරතුරු ගවේෂණ ක්‍රියාවලියේ දී තමා කෙතරම් සාර්ථක ද යන්න වටහාගත හැකි වීම
★ ගුරුවරුන් හා දේශකයින් සමඟ ගැටලු සාකච්ඡා, පන්ති කාමරයේ දී සිසුන් සමඟ සාකච්ඡා පවත්වමින් ගැටලු නිරාකරණය කර ගැනීමේ හැකියාව

* අනෙකෙකුගේ තොරතුරු අවශ්‍යතාව පැහැදිලි කර ගැනීමට ප්‍රශ්න ඇසීමේ කුසලතා සහිත වීම
* ලබාගත් තොරතුරු දැනට ලබා ඇති දැනුම ආකල්ප හා අත්දැකීම් සමඟ සම්බන්ධ කොට කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව
* තොරතුරු පැහැදිලිව හා නිවැරදිව තර්කානුකූලව හා අනුපිළිවෙලට අවශ්‍ය ආකාරයට හැසිරවීමේ හැකියාව (උදා: රචනාවක් ලෙස පෝස්ටරයක් ලෙස)
* විවිධ පුස්තකාල වර්ග, ඒවායේ එකතුන් හා ඒවා විසින් ලබා දෙන විවිධ සේවා පිළිබඳ අවබෝධය (උදා : අන්තර් පුස්තකාල පිරුළු සේවය යටතේ තොරතුරු ලබා ගැනීමේ හැකියාව පිළිබඳ දැනුවත්කම)
* තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වන කාල වකවානුව පිළිබඳ අවබෝධය
* සමාන පද, නියමු පද (Keywords) පිළිබඳ අවබෝධය හා භාෂා ප්‍රවීණත්වය
* තර්කානුකූලව සිතීමේ හා ගැටලු විසඳීමේ හැකියාව
* අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ මනාව සවන්දීමේ හැකියාව
* තොරතුරු අත්පත් කරගැනීමේ දී බලපාන නීතිමය, ආර්ථිකමය හා සමාජමය ගැටලු පිළිබඳ අවබෝධය (උදා : ප්‍රකාශන හිමිකම් නීතිය)
* තොරතුරු භාවිතයේ දී පිළිගත යුතු සදාචාරාත්මක තත්ත්වය පිළිබඳ අවබෝධය
* තොරතුරු ලබා ගැනීමේදී භාවිතයේ දී හා ගබඩාකරණයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගන්නා ආකාරය පිළිබඳ අවබෝධය (පරිගණක භාවිතය, දත්ත පදනම් හා අන්තර්ජාලය ඇසුරෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය හා විද්‍යුත් තැපැල යොදා ගනිමින් තොරතුරු සන්නිවේදනය කරන ආකාරය) තවද පරිගණක නිපුනතාව, මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුම හා තාක්ෂණික උපකරණ භාවිතයේ හැකියාව ද තිබිය යුතුය.
* ස්වාධීන පුද්ගලයෙකු ලෙස ඉගෙනීමට ඉගෙන ගැනීම [Information Skills in the School (2000)]

ඉහත දැක්වූ තොරතුරු කුසලතා සිසුන් තුළ වර්ධනය කිරීමේ දී පාඩම් ඒකක සපයා දීමෙන් ද, විකල්ප ඉගැන්වීම් ක්‍රම යෝජනා කිරීමෙන්ද, විෂය පථයට අදාළ පරිදි සම්පත් එකතුව කළමනාකරණය කිරීමෙන්ද, ශිෂ්‍යයින්ගේ විවිධ අභ්‍යාස නිර්මාණයේ දී සහාය වීමෙන් සහ ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීමට සහාය වීමෙන් ගුරු පුස්තකාලයාධිපතිවරයෙකුට සම්පත් පාදක අධ්‍යාපනයේ දී දායක විය හැක.

මෙම කුසලතා සිසුන් තුළ වර්ධනය කිරීමට ගුරු පුස්තකාලයාධිපති ඇතුළු ගුරුවරුන් විසින් තොරතුරු සාක්ෂරතා වැඩසටහන් හඳුන්වා දීමට කටයුතු කිරීමේ දී අවධානය යොමු කළ යුතු තවත් කරුණක් ඇත. එනම්, ඒ ඒ ශිෂ්‍යයින්ගේ වයස් මට්ටම හෙවත් අධ්‍යාපනික මට්ටම මත ඔවුනගේ සිතීමේ ශක්තිය වෙනස් වන බව තේරුම් ගැනීම, සිතීමේ කුසලතා වෙනස්වීම මත තොරතුරු අවශ්‍යතා සපුරාලීමේ දී තොරතුරු භාවිත කරන ආකාරය විවිධ විය හැකි බව අවබෝධ කරගැනීම, එසේම තොරතුරු භාවිතයේ හා තොරතුරු ඉදිරිපත් කිරීමේ සීඝ්‍රතාවද එකිනෙකාට වෙනස්වන බවද අවබෝධ කර තිබිය යුතුය.

තොරතුරු සුලබත්වය පමණක් වඩා දැනුවත් සමාජයක් ඇතිකරලීමට ප්‍රමාණවත් නොවන අතර, ඒ සඳහා තොරතුරු ඵලදායී ලෙස භාවිත කළ හැකිවන පරිදි වර්ධනය කර තිබිය යුතු තොරතුරු කුසලතා සතුවීම අතිශයින් වැදගත් වේ. තොරතුරු කුසලතා පිරිපුන් පුද්ගලයන් යාවජීව අධ්‍යාපනයට යොමුවන අතර, එමගින් වඩා දැනුවත් ජාතියක් බිහිකිරීමට හැකිවනු ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කිසියම් විෂය ක්ෂේත්‍රයකට සීමා නොවී සියලුම ක්ෂේත්‍රයන්ට සියලුම මට්ටම්වල දී අදාළ වන පරිදි තොරතුරු කුසලතා වර්ධනය කිරීම එම ජාතික ඉලක්කය කරා යාමේ දී අත්‍යවශ්‍ය වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

American Library Association Web site. Available at www.ala.org

Information Skills in the School (2000) Sydney: NSW Department of Educaiton

International Encyclopaedia of Information and Library Science.

ජයසූරිය, සුමනා (2003): සම්පත් පාදක ඉගෙනුම (Resource Based Learning ; *Sri Lanka Library Review* Vol. 17 pp. 9-15

Jayasuriya, Sumana (2001): The Role of the Teacher Librarian; *Sri Lanka Library Review pp. 9-17*

Moore, Penny (2000) Towards Information Literacy : One School's Journey; Wellington: New Zealand Council for Educational Research

Yapa, N.U. (1999) The Role of the Librarian in the Modern Information Society *Sri Lanka Library Review* pp. 1-11

# Empowering 8: the information literacy model developed in Sri Lanka to underpin changing education paradigms of Sri Lanka

[1]Pradeepa Wijetunge and [2]Uditha Alahakoon

ABSTRACT :Information literacy (IL) is the ability to identify, locate, evaluate, organize and effectively create, use and communicate information to address an issue or a problem. It is a basic human right to lifelong learning. Information itself is becoming a transforming strategic resource of the emerging information society. Without information literacy, the information society will not be able to achieve its full potential. Therefore, the concept and practice of information literacy must be promoted from an early age among the school going children. Information literacy is more relevant for the developing nations to enable themselves to bridge the growing info-divide between the developed and the developing nations. In this context, a regional workshop was organized by National Institute of Library and information Science (NILIS) to create awareness of information skills for learning among the participants from South and Southeast Asian countries.

